ආසියාවේ පළවන එකම කතෝලික ළමා පුවත් පත

ක්‍රි. ව. 2013 මාර්තු 18 සඳුදා
05 වෙළුම - 20 කලබ
සතිපතා පත්‍රය - පිටු 16
මිල රු 10.00

LP - QD / 52/ News/ 2013

# ළමා ප්‍රදීපය



## දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ස්ථාපිත කළ මහ බ්‍රහස්පතින්දා උතුම් මංගල්‍යය දිනයයි !

ළමා ප්‍රදීපය
ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා
කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් pradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.lk

# මහ බ්‍රහස්පතින්ද දින ස්ථාපිත වූ අන්තිම රාත්‍රී භෝජනය

## ආදරණීය දුවේ පුතේ...

අපි දැන් ක්‍රම ක්‍රමයෙන් ශුද්ධවූ සතිය කරා ලං වෙමින් ඉන්නවා. මේ ශුද්ධවූ සතිය පිළිබඳව ඔබ බොහෝ දෙනෙක් මේ වන විට හොඳ අවබෝධයක් ලබාගෙන ඇති කියා අපට හැඟෙනවා. කිතුනුවන් වන අපට වසරේ ශ්‍රේෂ්ඨතම සතිය වන්නේ ශුද්ධවූ සතියයි. එය ගොක් ඉරිදා සිට උත්ථානයේ ඉරුදින දක්වා විහිදෙනවා. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතයෙහි තීරණාත්මක එමෙන්ම උතුම් වූ සතිය මෙම අවසාන සතියයි. එතුමාණන්ගේ ජීවිතය මුළු ලොවටම එළිදරව් කළ සේවය, ප්‍රේමය , දුක් විඳීම , මරණය , ජයග්‍රහණය යන පස් වැදෑරුම් මූලික සත්‍යතාවයන් මෙම සතිය තුළ අපි සමරනවා.

ආදර දුවේ පුතේ, ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතය ලොවට දුන්නාවූ දෙව් පියාණන් වහන්සේට උපරිම ප්‍රශංසාව ගැයෙන මූලික සතිය ශුද්ධවූ සතිය ලෙස නම් වන්නේ ඇයිද යන්න මනාව දැන් ඔබට වැටහෙනවා නේද, ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ගොක් ඉරුදින ජෙරුසලමට ඇතුළු වුනේ එම වසරේ පාස්කු මහා මංගල්‍යය සැමරීමටයි. උන්වහන්සේ සමග මහා ජනකායක් වන්දනා ගමනක විලසින් ජෙරුසලමට ඇතුළු වුනා. මෙහිදි ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ සමග උන්වහන්සේගේ ශ්‍රාවකයන්ද එකතු වී සිටියා. මෙතනදි උන්වහන්සේ තමන් වහන්සේගේ ශ්‍රාවකයන් සමග ජෙරුසලමට ඇතුළු වන්නට පැමිණියේ බෙත්ෆාජය කියන කුඩා ගම්මානයේ සිටයි. එහි සම්පූර්ණ දුර ප්‍රමාණය සැතපුම් තුනක් වන බව පෙන්වා දී තිබෙනවා. ඔලිව් කොළ ඔසවාගෙන වන්දනා ගමනේ පෙරහරට නියමිත ගීතිකා ගයමින් ඔවුන් ජයග්‍රාහි ලීලාවෙන් ගමන් ගත් බව සඳහන් වෙනවා.

ආදර දුවේ පුතේ, අවුරුදු පතා පවත්වන මෙම චාරිත්‍රයේ ප්‍රධාන ගීතිකාවක් වී තිබුනේ පැරණි ගිවිසුමේ ගීතාවලියේ 118 වන ගීතිකාවයි. ''සමිඳුන්ගේ නාමයෙන් වඩිනා තැනැත්තේ ආසිරි ලද්දෙකි. (හොසන්නා) යන වචන තුළින් තමයි, මෙම ගීතිකාව පූර්ණ වී තිබුනෙ. ඒ අනුව තමයි. උන්වහන්සේගේ ශ්‍රාවකයින් එම වචනය ස්වාමින් වහන්සේට ජයඝෝෂා පවත්වන්නට යොදා ගත්තේ. සමිඳුන් නාමයෙන් වඩිනා තැනැන් වහන්සේ හැටියට නැතිනම් මෙසියස් තුමන් හැටියට උන්වහන්සේව ශ්‍රාවකයින් හඳුනාගෙන තිබුනා.

ආදර දුවේ පුතේ, ශුද්ධවූ සතිය ආරම්භ වන ගොක් ඉරිදා එලෙස හොසන්නා කියා පිළිගන්නා ස්වාමින් වහන්සේව ඒ සතියේම මහබ්‍රහස්පතින්ද වෙන කොට මරණයට තීන්දු කරන්න කතිකා පැවැත්වෙනවා. එයට මූලික හේතුව වුයේ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ජෙරුසලම් දේව මන්දිරය අසල පැවැත්වූ දේශනා මාලාවයි. මහා බ්‍රහස්පතින්ද නිර්මිත වන්නට තවත් අතීත කථාවක් බලපවත්වනවා. ජුදා දින දර්ශණයේ 14 වන දින සවස යාමය වාර්ෂිකව පැවැත්වූ ජුදා ආගමික හා සමාජීය ජීවිතයේ ඉතා උතුම් අවස්ථාව වුනා. ''පේසාක්'' නොහොත් පාස්කුව යන වචනයේ අදහස වන්නේ ''දෙවියන් වහන්සේ අප රැකගන්නා බවයි.' මිසරයේ වහල් බවින් මිදී යන අවස්ථාවේදී පාස්කු බැටළුවාගේ ලේ ගෙවල් උළුවහු මත තවරා දෙව් රැකවරණය ලබා ගත් බව ජුදා ආගමික පිළිගැනීමයි. පාස්කු මංගල භෝජනය තම නිවෙස් වල ගැනීම පූජනීය අවස්ථාව වුනා. මහා පාස්කු මංගල්‍යයෙන් හා පාස්කු භෝජනයෙන් සිහිපත් කරනු ලබන්නේ දෙවියන් වහන්සේ තම ජනතාව වහල් බවින් මිසරයෙන් මුදගත් බවයි. එසේම ඉන් පසුව පැමිණි සෑම මිදීමක්ම මෙම සැන්දෑවේදී ඔවුන් සිහිපත් කළා. මෙම ආගමික හා චාරිත්‍රානුකූල භෝජනය තුළ ශුද්ධ ලියැවිලි ග්‍රන්ථයෙන් කියවීමද , පාස්කු බැටළුවා , නුමුහුන් රොටි, තිත්ත පලා අනුභවයද මිදිරස ගැනීමද අන්තර්ගත වුනා. අවසානයේදී ප්‍රශංසා ගී කිහිපයක්ම ගීතාවලියෙන් ගයනා කළා.

දැන් බලන්න ආදර දුවේ පුතේ, සැබෑ ජුදා බැතිමතෙක්වු ජේසුස් ක්‍රිස්තුන් වහන්සේත් චාරිත්‍රානුකූලව තමන් වහන්සේගේ ශ්‍රාවකයන් සමඟ මෙම පාස්කු භෝජනය සැමරීමට සූදානම් වුනා. නමුත් උන්වහන්සේ මෙයට නව අරුතක් එක් කළා. එනම් එතුමාගේ ජීවිත පූජාවයි. පුරාණයේදී බැටළුවාගේ ලෙය මිදීමේ සළකුණ වුනා. ක්‍රිස්තු යුගයේදී ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ රුධිරය මිදීමේ ජීවමාන සළකුණ බවට පත් වෙනවා. පාස්කු භෝජනයේ තුන්වෙනි කොටසේදී නුමුහුන් රොටිය රැගෙන මෙය ''ඔබ උදෙසා පිදෙන මාගේ ශරීරයයි. මෙය අනුභව කරන්න.'' ඉන්පසු මිදිරස කුසලානය රැගෙන ''මෙය බොහෝ දෙනා වෙනුවෙන් වගුරුවනු ලබන මාගේ ගිවිසුම් රුධිරයයි'', යන්න පවසනු ලබනවා. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ අපගේ නව පාස්කු බැටළුවායි. එතුමාගේ ශරීරය හා රුධිරය අපගේ විමුක්තියේ ශක්තියයි. බලන්න කෙතරම් උතුම් පණිවිඩයක් හා විශ්වාසයේ ජීවිත යථාර්ථයක් මෙහි ගැබ්වී තිබෙනවාද? අපි මේ ගැන හොඳ මෙනෙහි කිරීමක් මේ එළෙඹෙන ශුද්ධවූ සතිය තුළදී ඉටු කරන්නට සිතා ගනිමු.

**ඔබට ජේසු පිහිටයි.**

සංස්කාරක

**ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා**

# චතාරික සමයේ වත් පිළිවෙත්

එස් රන්දිල් ප්‍රනාන්දු
නි.ම.නි පියතුමන්
වසිනි



දයාබර දුවේ පුතේ, චතාරික කාලය අළු බදාදා දිනෙන් ආරම්භ වී ගොබ් ඉරුදින දක්වා දිවෙන අතර පසුව ශුද්ධ සතියට පිවිසෙයි. මහ බ්‍රහස්පතින්දා, මහ සිකුරාදා, ආලේලූයියා සෙනසුරාදා හා පාස්කු ඉරිදා කිතුනු අපගේ උච්චතම මංගල්‍යයක් සමරන දින වන අතර පසුව අපි පාස්කු සමයට පිවිසෙමු.

මේ දින 40 හා ශුද්ධ සතිය පුරාවටම විවිධ සංකේත, සලකුණු හා වෙනස්කම් අපගේ දෙව් මැදුරුවල සිදුවේ.

- ⋆ අළු බදාදා - අළු තැවරීම
- ⋆ ගොබ් ඉරිදා - ගොබ් කුරුස සෑදීම
- ⋆ චතාරිකයේ අපි ආලේලූයියා හා පැසසුම් ගීය ගායනා නොකරමු.
- ⋆ අල්තාර රෙදි දම් පාටින් ඇමීම සිදු කරයි.
- ⋆ විවාහ මංගල්‍ය සිදු නොකරයි.
- ⋆ චතාරිකයේ කිතු තුමන්ගේ දුක් ප්‍රාප්තිය, මරණය මුලික කරගත් ගීතිකා ගායනා කරනු ලබයි.
- ⋆ අල්තාරයේ සැරසිලි අඩුවෙන් කරනු ලබයි.
- ⋆ පාද නමස්කාර භක්ති අභ්‍යාස සිදු කරයි.
- ⋆ චතාරික වන්දනා ගමන් ආරම්භ කරයි.
- ⋆ එක්වරු ශීල රැකීම
- ⋆ මර්ධන ක්‍රියා කිරීම
- ⋆ දානමය කටයුතු කිරිම

**මාර්තු 19 වෙනිදාට පමණක් ඉහත වෙනස්කම් තාවකාලිකව නවත්වා මංගල්‍යයක් ගන්නේ එදින ශු. ජුසේ මුනිඳුන්ගේ මංගල්‍යය නිසාය.**

### මහ බ්‍රහස්පතින්දා

- ⋆ සීනු ගැසීම හා පැසසුම් ගීය
- ⋆ පාද දෝවනය හා පූප බෙදා දීම
- ⋆ සත්ප්‍රසාද කුඩුව හිස්ව තබයි.
- ⋆ වෙනම මණ්ඩපයක සත්ප්‍රසාද වහන්සේව තැන්පත් කරයි.
- ⋆ නිහඬතාව තුළ භාවනා කරයි
- ⋆ අල්තාර රෙදි ඉවත් කරයි
- ⋆ දෙව් මැදුරු වල කුරුස ඉවත් කිරිම හෝ ආවරණය කර ඇමීම
- ⋆ මධ්‍යම රාත්‍රිය තෙක් දිව්‍ය සත්ප්‍රසාද වන්දනාව සිදු කිරිම

### මහ සිකුරාදා

- ⋆ දේව වාක්‍යයට ඇහුම්කන් දීම
- ⋆ පොදු ඉල්ලීම් හා යැදුම්
- ⋆ කුරුසියේ වන්දනාව
- ⋆ පසන් හා ලතෝනි ගායනා කරයි
- ⋆ දිව්‍ය සත්ප්‍රසාද බෙදා දීම

### ආලේලූයියා සෙනසුරාදා (පාස්කු මෙහෙය)

- ⋆ ආලෝකයේ මෙහෙය
- ⋆ (ගිනි ආශිර්වාදය)
- ⋆ පාස්කු ඉටි පහන් දැල්වීම
- ⋆ දේව වාක්‍ය මෙහෙය
- ⋆ ආලේලූයියා
- ⋆ ප්‍රසාද ස්නාපන අලුත් කිරිමේ මෙහෙය
  - ජලය ආශිර්වාදය
  - දිව්‍ය සත්ප්‍රසාද මෙහෙය

ඉහත වෙනස්කම් තුළින් කිතුනු අපගේ ජිවිතද සැබෑ වෙනස්කමකට ආරාධනා කරයි. ඒ සඳහා පුංචි ඔබත් චතාරිකයේ වත්පිළිවෙත් වලට භක්තියෙන් සහභාගි වන්න.

---



65 වෙනි වරට, තේවත්ත ජාතික බැසිලිකාවේ පවත්වන ලද ළමා දිනයට විශාකාවත්ත සාන්ත කෝල්බේ දහම් පාසලෙන් ඊට සහභාගිවූ දරු දැරියන්ගෙන් කොටසක්, මීසම් පාලක ගුරු ලෙස්ටර් නෝනිස් පියතුමා සමගින්

**සේයා /සටහන :- ෂර්ලි පෙරේරා**



## හලාවත පදවිය

හාල්දඬුවන ජේසුතුමන්ගේ දිව්‍ය හෘදයේ අප ස්වාමිදුවගේ දේවස්ථානයේ දූ පුතුන් පනස් දෙනෙක් පළමුවරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගත්හ. ඉන් අනතුරුව මීසම් සේවක ගරු ප්‍රැන්සිස් ලාවුස් පියතුමන් සහ මෙම දරුවන් සූදානම් කළ ගුරු මැණිවරුන්ද දහම් පාසලේ ප්‍රධානාචාර්ය නීල් වර්ණකුල යන අය ළමුන් සමඟ මෙසේ ළමා ප්‍රදීපය සඳහා සමූහ සේයාරුවකට පෙනී සිටි අයුරු. **(ටෙක්ලා කල්දේරා)**



## කොළඹ පදවිය



## පළමු වරට දිව බොදුන් ලැබීම

කිඹුලාපිටිය නිර්මල ලූර්දු මාතා සිද්ධස්ථානයට අයත් දරු දැරියන් 27 දෙනෙකුට ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ දනය කිරීමේ දෙව් පුද මෙහෙය පසුගියදා එම දෙව්මැදුරේ පැවැත්විණි.

දිව්‍ය යාගය අවසානයේදී මෙදින දිව්‍ය සත්ප්‍රසාද ලබාගත් දරු දැරියන් මීසම් සේවක ගරු රුවන්දන මෙන්ඩිස් පියතුමන් සහ ගරු පැවිදි සොයුරියන් දහම් ගුරුවර ගුරුවරියන් සමඟ ළමා ප්‍රදීපය කැමරාවට මුහුණ දුන් අයුරු. **(ටී. සුනිල් ප්‍රනාන්දු)**



මාසික සිතිවිල්ල

## මාසික සිතිවිල්ල

"මාර්තු මාසය"
ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත,
කොළඹ 08.

**සේයා : ප්‍රියන්ත පීටර්ස් (වෙන්නප්පුව)**

## දෙවිඳුන් ඉදිරියේ....

දෙවිඳුන් ඉදිරියේ....
වෙමු අප දුවිලි බිඳක් පයට පෑගෙන
සමාජය ඉදිරියේ - සාධාරණයට ගරු කරන පිරිසක් වෙමු
මතු පරපුර උදෙසා.....
තාන්න මාන්න ඉදිරියේ - හිස නොනමමු ලෞකික දේ
අපට නොවැදගත් නිසා.......
ප්‍රේමය ඉදිරියේ - හදවතක් ඇත්තන් වෙමු දෙවිඳු ප්‍රේමය
සැමට බෙදනා .......

**අශානි නවින්ද්‍යා තමෙල්**
**09 ශ්‍රේණිය - සින්දත්‍රිය දහම් පාසල**

**ළමා ප්‍රදීපය විශේෂ පාස්කු කලාපය ලබන සතියේ**

# සිසුනායක වැඩමුළුවක්



වැලිහේන මීසමට අයත් වැලිහේන ශු. කයිතාන් , ඇත්ගාල ශු. මරිය ගොරෙත්ති , දකුණු වැලිහේන ශු. සෙබස්තියන් දහම් පාසල් හි 2013 වසරේ සිසු නායක නායිකාවන් සඳහා විශේෂ වැඩමුළුවක් පසුගියද වැලිහේන ශු. කයිතාන් මුනි දේවස්ථානයෙහි දී පැවැත්වුණි. මෙය මෙහෙයවනු ලැබුවේ ළමා ප්‍රදීපය සහය සංස්කාරක දේශක, කුමර නයනජිත් මහතාය.මෙයට එක්වූ පිරිසට ශිෂ්‍ය නායකයකු යනු කවුරුන්ද? මොවුන් සතු වගකීම් , තිබිය යුතු වටිනා ගුණාංග ආදි කරුණු රැසක් පිළිබඳව අවබෝධයක් ලබා දුන් අතර අවසානයේදී කණ්ඩායම් සාකච්ඡාවක් හා අභ්‍යාසයක්ද ලබා දුනි. වැලිහේන මීසම් සේවක ගරු නිශාන්ත රුද්‍රිගු පියතුමාගේ අනුශාසකත්වයෙන් ගරු ඇනිටා (ය.ඒ.නි ) පැවිදි සොයුරිය හා ආචාර්ය මණ්ඩලයේ සහයෙන් මෙදින කටයුතු සංවිධානය කෙරිණි.

# පල්ලන්සේන කිතු දහම් පාසලේ ශූර ළමා ලේඛකයෝ

## (වැඩමුළුවක ප්‍රතිඵලයක්)

## ආදර දෙමාපියන්

දෙව්පිය සමිඳුන් මා හට දුන්
තිළිණයකි මාගේ දෙමාපියන්
රැකගනු මැන ආදර සමිඳේ
මාගේ ආදර දෙමාපියන්

**ෂෙරිකා සෙව්වන්දි**
09 ශ්‍රේණිය
කිතු දහම් පාසල - පල්ලන්සේන



**සචිනි මධුෂානි** - 09 ශ්‍රේණිය
කිතු දහම් පාසල - පල්ලන්සේන



## ගුරු මව්නි

දෑස් අන්ධ වී සිටි
පුංචි කිරිල්ලියකට
මෙවන් සුන්දර ලෝකයක්
ඇගේම නෙතින්
දැකීමට උදව් වුනේ
ඔබයි ගුරු මව්නි .......

ජීවිතය, ළමා කාලය
නිවැරදිව වැටහීමට
සවිය දුන්නේ ද
ඔබමයි මව්නී ....

පොතේ පතේ දැනුම
පමණක් නොව
ජීවිත ජලයෙන්ද
මගේ පිපාසය
සංසිඳවුයේද ඔබයි.....

**සුලේකා ප්‍රනාන්දු** - 08 ශ්‍රේණිය
කිතු දහම් පාසල - පල්ලන්සේන

## මම කිතුනු දරුවෙක්මි

මව් කුස තුළ සිට මෙලොව එළිය බැලූ අප ප්‍රසාදස්නාපනය ලැබූ මොහොතේ සිට දේව දරුකම ලැබූ වෙමු. මව පියා, සහෝදර සහෝදරියන් හා නෑදෑ හිතමිතුරන්ගෙන් ප්‍රේමයෙන් , ස්නේහයෙන් වැඩුණු මාගේ ජීවිතයේ පරමාදර්ශය වනුයේ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ බව දක්වන්නෙමි.

ආදර්ශය ඉතා උතුම්බව සිතෙහි ධාරණය කරගනිමින් දෙමාපිය උපදෙස් හා හැසිරීම් වලට ගරු කරමින් ජීවත්වීමට අදිටන් කරගන්නවා පමණක් නොව ක්‍රියාවටද නැංවීමට කැමැත්තෙමි. දෙමව්පියන්ට ඇඩි ලෙස ආදරය කරන මා ඔවුන්ට කීකරු වීමට මට හැකි තරමින් උත්සහ කරමි. අම්මගේ , තාත්තගේ හීනය වන මා හොඳින් ඉගෙනගෙන රටට දැයට වැඩදායී කෙනෙක් වීම හා දෙමව්පියන්ට සැලකීමද මාගේ හීනයයි. සැම දෙනාටම ප්‍රිය වචන කථා කරන මා හොඳ කිතුනු දරුවෙක් වීමට උත්සහ කරමි.

පාසලේ ගරුත්වය රැකෙන සේ මා දැනුම හදාරන පාසලට ගරු කරමි. මම ඉතා සංවේදී අයකු නිසා අන් අයගේ දුක වේදනාවේදී ඔවුන්ට පිහිට වෙමි. සැමගේම ඇසට ප්‍රිය, සංවර ඇඳුම් අඳිමි. සැමවිට ක්‍රිස්තුන් වහන්සේව ආදර්ශයට ගනිමින් දේව දරුකම ලබා ගැනීමට අදිටන් කර ගනිමි.

**කුෂලිකා ප්‍රනාන්දු**
09 ශ්‍රේණිය - කිතු දහම් පාසල - පල්ලන්සේන

# 2013 සසුන් පිය නිලවරණයට සහභාගි

**පසුගිය සතිය හා සබැඳේ**

## සසුන් නීතිය අනුව 2013 පෙබරවාරි 28 දාට


අතිඋතුම් ඔඩිලෝ පේඩ්රෝ කාදිනල් සියර් හිමි - 1949 සැප්. 21 - බ්‍රෙසිලය


අතිඋතුම් ලියනාඩෝ කාදිනල් සැන්ඩ්‍රි හිමි - 1943 නොවැ. 18 - ආජන්ටිනාව


අතිඋතුම් ඇන්ජලෝ කාදිනල් කොමස්ට්‍රි හිමි - 1943 සැප්. 17 - ඉතාලිය


අතිඋතුම් ප්‍රැන්සිස්කෝ කාදිනල් මොන්ට්‍රිසි හිමි - 1934 මැයි 28 - ඉතාලිය


අතිඋතුම් ඩොනල්ඩ් විලියම් කාදිනල් වුර්ල් හිමි - 1940 නොවැ. 12 - ඇ.එ. ජනපදය


අතිඋතුම් රාෆායල් කාදිනල් ෆරිනා හිමි - 1933 සැප්. 24 - ඉතාලිය


අතිඋතුම් වෙලාසියෝ කාදිනල් ඩි පාඕලිස් හිමි - 1935 සැප්. 19 - ඉතාලිය


අතිඋතුම් ජෝර්ජ් කාදිනල් ඇලන්චෙරි හිමි - 1945 අප්‍රේල් 19 - ඉන්දියාව


අතිඋතුම් කර්ට් කාදිනල් කෝච් හිමි - 1950 මාර්තු 15 - ස්විස්ටර්ලන්තය


අතිඋතුම් ඇන්ටෝනියෝ මාරියා කාදිනල් වෙග්ලියෝ හිමි - 1938 පෙබ. 03 - ඉතාලිය


අතිඋතුම් තිමති මයිකල් කාදිනල් ඩොලන් හිමි - 1950 පෙබ. 06 - ඇ.එ. ජනපදය


අතිඋතුම් ප්‍රනාන්දු කාදිනල් ෆයිලෝනි හිමි - 1946 අප්‍රේල් 15 - ඉතාලිය


අතිඋතුම් ඩොමිනිකෝ කාදිනල් කැල්කාග්නෝ හිමි - 1943 පෙබ. 03 - ඉතාලිය


අතිඋතුම් රූබන් කාදිනල් සැලේස ගෝමස් හිමි - 1942 සැප්. 22 - කොලොම්බියාව


අතිඋතුම් ප්‍රැන්සිස්කෝ කාදිනල් කෝකෝපැල්මේරියෝ හිමි - 1938 මාර්තු 06 - ඉතාලිය


අතිඋතුම් ජේම්ස් මයිකල් කාදිනල් හාර්වි හිමි - 1949 ඔක්. 20 - ඇ.එ. ජනපදය

# වීමට සුදුසුකම්ලත් කාදිනල් හිමිපාණෝ

ශිරාන් මෛත්‍රී විසිනි

## වයස අවුරුදු 80 ට අඩු කාදිනල් හිමිපාණෝ


අතිඋතුම් ෆ්‍රෑන්ක් කාදිනල් රෝඩ් හිමි - 1934 සැප්. 23 - ස්ලෝවේනියාව


අතිඋතුම් ස්ටැනිස්ලෝ කාදිනල් රිල්කෝ හිමි - 1945 ජුලි 04 - පෝලන්තය


අතිඋතුම් රේමන්ඩ් ලියෝ කාදිනල් බර්ක් හිමි - 1948 ජුනි 30 - ඇ.එ. ජනපදය


අතිඋතුම් ගියෙන්ෆ්‍රැන්කෝ කාදිනල් රවාසි හිමි - 1942 ඔක්. 18 - ඉතාලිය


අතිඋතුම් ගියොජ්සි කාදිනල් බර්ටෙල්ලෝ හිමි - 1942 ඔක්. 01 - ඉතාලිය


අතිඋතුම් ගියොජ්සි කාදිනල් වර්සල්ඩි හිමි - 1943 ජුලි 30 - ඉතාලිය


අතිඋතුම් ජියෝවන්නි කාදිනල් ලාජෝලෝ හිමි - 1935 ජන. 03 - ඉතාලිය


අතිඋතුම් ඇන්ජලෝ කාදිනල් අමාටෝ හිමි - 1938 ජුනි 08 - ඉතාලිය


අතිඋතුම් පාවුලෝ කාදිනල් සාර්ඩි හිමි - 1934 සැප්. 01 - ඉතාලිය


අතිඋතුම් මැනුවල් මොන්ටිරෝ කාදිනල් ඩි කැස්ත්‍රෝ හිමි - 1938 මාර්තු 29 - පෘතුගාලය


අතිඋතුම් ජෝ බ්‍රාස්ඩි කාදිනල් අවීස් හිමි - 1947 අප්‍රේ. 24 - බ්‍රසීලය


අතිඋතුම් පෝල් ජෝසප් කාදිනල් කෝඩ්ස් හිමි - 1934 සැප්. 05 - ජර්මනිය


අතිඋතුම් රොබට් කාදිනල් සාරා හිමි - 1945 ජුනි 15 - ගයනාව


අතිඋතුම් මවුරෝ කාදිනල් පියාසෙන්සා හිමි - 1944 සැප්. 15 - ඉතාලිය


අතිඋතුම් සැන්ටෝස් ඇබ්‍රිල් කාදිනල් කැස්ටෙල්ලෝ හිමි - 1935 සැප්. 21 - ස්පාඤ්ඤය


අතිඋතුම් එඩ්වින් ෆෙඩ්රික් කාදිනල් ඕබ්‍රයන් හිමි - 1939 අප්‍රේල් 08 - ඇ.එ. ජනපදය

# දංකොටුව බාලිකා මහා



දංකොටුව බාලිකා මහා විද්‍යාලයේ 20 වන සංවත්සරය පසුගිය දිනට යෙදී තිබිණි.

එය නිමිති කරගෙන දෙවිදුන්ට තුති පිදීමේ පූජාවක් සලාපුර රදගුරු අති උතුම් දෙව්ශ්‍රීත වැලන්ස් මෙන්ඩිස් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. අනතුරුව 20 වසර සමරමින් ප්‍රදේශයේ දුප්පත් පවුල් 20 ක් සඳහා වියළි ආහාර මළු බෙදාදීම ද රදගුරුතුමන් අතින් සිදුවිය. මෙම අවස්ථාවට සලාපුර පදවි අනුශාසක අතිගරු පීටර් චාල්ස් පියතුමන් ද පදවි අධ්‍යාපන කටයුතු සහායක ගරු ධනුෂ්ක ප්‍රනාන්දු පියතුමන්ගේ ද කටුකෙන්ද දොන් බොස්කෝ දෙව්සත්හලේ අධ්‍යක්ෂ ගරු ඩික්සන් ප්‍රනාන්දු පියතුමන් ඇතුළු පියතුමන්ලා ද සුරදූතික නිකායේ ගරු ජේමන් විජේසූරිය ශ්‍රේෂ්ඨ මව්තුමිය ඇතුළු







# ා විද්‍යාලයේ

## 20 වන සංවත්සරය

පැවිදි සොහොයුරියන් සහ විශාල පිරිසක් සහභාගී වී සිටියහ. මෙයට සමගාමීව සිසු කුසලතා ඔප් නංවමින් දින 04 ක් පුරා අධ්‍යාපන ප්‍රදර්ශනයක් ද පැවැත්විණි.

පළමු දිනය බෝලවත්ත දිසානායක ගරු සිල්වෙස්ටර් විජයකුලසූරිය පියතුමාගේ ප්‍රධානත්වයෙන් ද දෙවන දිනය හලාවත කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ අසෝක ජයලත් මහතාගේ ප්‍රධානත්වයෙන් ද , ප්‍රදේශයේ සුබපතන්නන් වෙනුවෙන් වෙන්කර තිබූ තෙවන දිනය. රිචී ප්‍රනාන්දු පුල්ලේ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සහ සිව්වන දිනය ගරු අධ්‍යාපන අමාත්‍ය බන්දුල ගුණවර්ධන මැතිතුමාගේ සහ ප්‍රදේශයේ දේශපාලන අධිකාරියේ සහභාගීත්වයෙන් පැවැත්විණි.

ඇන්ටන් ජෙරාඩ් විසිනි









# ශු. ස්නාවක ජුවාම් තුමා



ස්නාවක ජුවාම් තුමා දිව්‍යසිවරයකු ලෙස සලකනු ලැබේ. එතුමාගේ ජීවිතයේ ප්‍රධානතම දැක්ම මනස්ථාපනයයි. එතුමාගේ මවගේ නම එලිසබෙත්ය. එතුමාගේ පියාගේ නම සකරියස් ය. එතුමාගේ පියා පූජකවරයෙකි. එතුමා ජේසුස් වහන්සේගේ පැමිණීමට ජනතාව සූදානම් කළේය.

ජනතාවට මනස්ථාපනය හා බෞතිස්ම ස්නාපනය ලබා දුන්නේය. ශු. බයිබලයේ සඳහන් වන ලෙස එතුමා උතුම් දිව්‍යසිවරයෙකි. පාළුකරයෙහි මොර ගසන හඬ කියා යෙසායා දිව්‍යසිවරයාගේ පොතෙහි එතුමාව හඳුන්වයි. ස්නාවක ජුවාම් තුමා නොබියව නිවැරදි සත්‍ය ප්‍රකාශ කළේය. ස්නාවක ජුවාම් තුමා ගත කළේ තාපස ජීවිතයකි. එතුමාගේ ආහාරය වූයේ වන මී සහ පලගැටියන්ය. එතුමා ඔටු ලොම් වස්ත්‍රයක් හැඳ සිටියේය. එතුමා සාධාරණය, යුක්තිය වෙනුවෙන් නොබියව කතා කළේය. ජේසුස් වහන්සේ වැඩි වර්ධනය විය යුතු බවත් තමන් ක්‍රමිකව අඩු විය යුතු බවත් ජනතාවට පෙන්වා දුන්නේය.

ජේසුස් වහන්සේ බෞතිස්ම ස්නාපනය කළ මෙතුමා උතුම් දිව්‍යසිවරයෙකි. මෙතුමාව විවිධ නම් වලින් හඳුන්වයි. එනම් පහන් ටැඹ, නව ගිවිසුම හා පැරණි ගිවිසුම යා කරන පාලම යනුවෙනුයි. එමෙන්ම මෙතුමා නව ගිවිසුමේ හා පැරණි ගිවිසුමේ සිටින එකම දිව්‍යසිවරයායි.

සියල්ල ජේසුස් වහන්සේ තුළ අත්දකින්නටත් ආත්මය හා හදවත දේව ප්‍රේමයෙන් පුරවන්නටත්, ජේසු අනුව ජීවත් වීමටත් අප ක්‍රියා කාරීත්වයන් දේව ප්‍රශංසාවට ලක් වන ලෙස ක්‍රියා කරන්නට එතුමාගේ ඉගැන්වීමෙන් අපට මඟ පෙන්වයි. මන්ද ස්නාවක ජුවාම් තුමා ජීවත් වුණේ තමන් උදෙසා නොව අන් අය වෙනුවෙන් බව තම ක්‍රියාවෙන් ජනතාවට පෙන්වා දුනි. එය අපි අපගේ ජීවිත වලට පසක් කර ගනිමු.

**ඉෂානි අංජලිකා**
08 ශ්‍රේණිය
සා. ජෝශප් දහම් පාසල - කොලොන්නාව

## දන්කොටුව උත්ථාන වූ සමිඳුන්ගේ දහම් පාසල

**දහම් පාසල් ත්‍යාග ප්‍රදානෝත්සව**

ගොඩැල්ල මීසමට අයත් දන්කොටුව උත්ථාන වූ සමිඳුන්ගේ දහම් පාසලේ වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවය සහ කුසලතා දැක්ම පසුගියදා පවත්වන ලදී. මෙදින අවස්ථාවක් සේයාරුවෙහි වෙති. **ටෙක්ලා කල්දේරා**



## වත්තල සා. ආනා දහම් පාසල

**සිසු නායක පදක්කම් පැළැඳවීම**



වත්තල සා. ආනා දහම් පාසලේ ශිෂ්‍ය නායක, නායිකාවන් හට පදක්කම් පැළැඳවීමේ දිව්‍ය යාගය මීසම් සේවක ගරු බැසිල් වික්‍රම සිංහ මීසම් සහයක ගරු ප්‍රියශාන්ත පියතුමාගේ ප්‍රධානත්වයෙන් සිදු කෙරුණි.

දේව මෙහෙය අවසානයේ ගරු පියතුමන්ලා, ගරු පැවිදි සොයුරියෝ හා දහම් ගුරුවරු ශිෂ්‍ය නායක නායිකාවන් සමූහ ඡයා රූපයකට පෙනී සිටී අයුරු. පැවිදි සොයුරියෝ, දහම් ගුරු මණ්ඩලය එක්ව මෙය සංවිධානය කළහ.

**ඩබ්ලිව් . ඇන්ටනී පෙරේරා**
වත්තල

# ක්‍රිස්තියානි කලාවේ අගතැන්පත් කලාකරුවෝ - උච්ච පුණරුද යුගය (10)

ක්‍රිස්තු භක්තික කැටයම් කරුවකු වශයෙන් මයිකල් ආන්ජලෝගේ ඒ නිහතමානි කියමන තවත් අංශයකින් අතිශයින් වැදගත්ය. ක්‍රිස්තියානි ඉතිහාසය තුළ කැටයම් කලාව ස්වාධීන කලාවක් බවට පත්කරන්නේ ඔහුය. ඒ දක්වා ක්‍රිස්තියානි කලා ක්ෂේත්‍රය තුළ කැටයම් කලාව හැම විටම සැලකුනේ ගොඩනැගිලි ශිල්පයේම කොටසක් සේය.

බිත්තියටම කවනු ලැබූ බිත්තියේම සැරසිල්ලක් සේය. රෝම පිළිම රෝම ආගමට සම්බන්ධවී තිබුණ නිසාදෝ කැටයම් කලාව ඒ දක්වා ක්‍රිස්තියානියෙන් මගහැරුනේය. එය ක්‍රිස්තියානියට ඇතුළු වන්නේ ග්‍රීක රෝම පුනරුද යේම ආයාදයක් සේය.

මයිකල් ආන්ජෙලෝව ප්‍රසිද්ධියට පත්කළ ප්‍රථමතම විශිෂ්ට කෘතිය ''භක්තිය'' යන අර්ථය ඇති පියෙටා (pieta) යන්න ය. ක්‍රිස්තුන් වහන්සේගේ මව මළාවූ තම පුත්‍රයාව තම උකුළේ ආදරයෙන් තබාගෙන සිටිනු එයින් දැක්වේ. එම රූපවල ප්‍රමාණය සාමාන්‍ය මිනිසකුගේ උසමහතට වඩා මදක් වැඩිය. එවැනි ද්විපුද්ගල රූපයක් තැනීමේදී කැටයම් කරුවකුට ඇතිවන කාර්මික ප්‍රශ්න සුළුපටු නොවේ.

ක්‍රිස්තුන් වහන්සේගේ දිගාවුනු සිරුර රඳවාගෙන සිටීමට නම්, මරිය තුමියගේ රූපය බොහෝ සෙයින් විශාල කළ යුතු වූයේ ය. කාන්තා ලාලිත්‍යය නොමැකෙන සේද, බරපතළ ගතියක් නොපෙනෙන සේද, එය සකස් කළ යුතුවිය. මයිකල් ආන්ජලෝ ඒ දුෂ්කරතාවය ජයගත්තා පමණක් නොව, දැඩි පුත්‍ර භක්තියක් ද, මැඩපවත්වාගත් දොම්නසක්ද මරියතුමියගේ මුහුණින් ප්‍රකාශ වෙන විලාශයකට ඔහුට එය සකස්කළ හැකි විය.



1508 දී සිස්ටයින් වැපලය'' නමින් හැඳිවෙන පාප්තුමාගේ පෞද්ගලික දේවස්ථානයේ විශාල සිවිලීම සැරසීමේ මහගු කාර්යය පාප්තුමා විසින් 1508 දී මයිකල් ආන්ජලෝට පවරන ලද්දේය.

ඔහුගේ අසමාන්‍ය කුසලතා වලට ගරුකිරීමක් වශයෙන් චිත්‍ර වලට යෝග්‍ය මාතෘකා ඔහුටම තෝරා ගන්නට ඉඩදෙනු ලැබුවේය.

එතැන් සිට අවුරුදු හතරක් ගතවන තෙක් ඔහුගේ කාලයෙන් වැඩිම ප්‍රමාණයක් ඔහු ගත කළේ අඩි 60 ක් උස්වූ පලංචි මත උඩුබැලි අතට වැතිරීසිට ගෙනය. එසේ වැතිරීසිට ගෙන එම චිත්‍රයේ ප්‍රබන්ධයට අයත්වූ විවිධ පුද්ගල රූපද දර්ශණද එකිනෙක ඔහු එකතු කළේය. පින්තාරුවට යොදනු ලැබූ තීන්ත බුරුසුව දිගේ ඔහුගේ අත්වලද මුහුණේද වැක්කෙරුනේය.

ඔහුගේ සිරුර බොහෝවිට හිරිවැටුන තත්වයකටද පත් වුනේය. විශ්වයේ නිර්මාණයද දිවැසිවර කථා පුවත්ද දක්වන මෙම මහා චිත්‍රයෙන් ඉගැන්වෙන පාඩම් තේරුම් ගැනීමට තැත්කරමින් මුළු ජීවිත කාලයක් වුවද කෙනෙකුට එය දෙස බලාගෙන සිටිය හැක.

එම චිත්‍රයෙන් කාගේ වුවද ඇසට පළමුවෙන් ම කාවදින්නේ දෙවියන් විසින් මිනිසා මවනු ලැබීම දක්වන මැදි කොටසය. පණදෙන දෙවියන්ගේ දිග හැරුනු අත පණ ලබන ආදම්ගේ දිග හැරුණු අත සමග තුඩින් තුඩ සම්බන්ධ වන්නේය.

එම ප්‍රාණය තම අත දිගේ තම හිසදක්වා කිඳා බසින විලාශයත් තමන්ට ලැබුණු මහගු ආයාදයට ආදම් ස්තුති පූර්වකව දෙවියන් දෙස බලා ඉන්නා විලාශයත් දැකුම් කළුය. ආදම් මෙහි දක්වා තිබෙන්නේ පවට වැටීමට පෙර ඔහු තුළ වූ කඩවසම් ස්වරූපයෙන් ය.

එහෙත් ඒ කඩවසම් භාවය සමග ඔහුගේ අහිංසක භාවයද, තුවාලවීම් වලට පහසුවෙන් ඉලක්ක වෙන ලද බොළඳ ගතියද පැහැදිලිව දක්නට ලැබේ.

වයසින් වැඩෙනවාත් සමග කලාව වෙත ආන්ජෙලෝ තුළවූ දෘෂ්ඨිය ක්‍රමක්‍රමයෙන් දේව භක්තියකම ස්වරූපය දරන්නට විය. වරක් ඔහු තම යාළුවෙකුට ප්‍රකාශ කළ පරිදි අප ස්වාමින් වහන්සේගේ පූජනීය ස්වරූපය තරමකට හෝ පිටපත් කරන්නට කලා කුසලතා හෝ උගත්කමක් හෝ තිබිම මදි ය.

මම හිතන්නේ හොඳ කලාකරුවෙක් අනිවාර්යෙන්ම දැහැමි ජීවිතයක් ගත කරන පුද්ගලයෙක් , නැතිනම් සාන්තුවරයෙක් වුවද විය යුතුය කියා ය. දේව ආත්මයට මිනිස් ආත්මය ආලෝකමත් කළ හැකිවන්නේ එවිට පමණි.

**සංස්කාරක පියතුමන් විසිනි**

ඉදිරියට .......



**ස්ටෙෆනි ප්‍රනාන්දු**
04 ශ්‍රේණිය
සාන්ත මරියා ප්‍රාථමික බලිකා විදුහල
හලාවත

## පුංචි අපේ චිත්‍ර පිටුව

පුංචි අපේ චිත්‍ර පිටුව සඳහා ඔබ අඳින චිත්‍ර, පාසලේ හෝ දහම් පාසලේ පංති භාර ගුරුතුමාගේ සහතිකය සමග ඔබේ නම, පංතිය, පාසල ඇතුළත්ව ඔබේ පෞද්ගලික ලිපිනය හා දුරකතන අංකය ද සහිතව යොමු කරන්න.

"පුංචි අපේ චිත්‍ර පිටුව"
ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත,
කොළඹ 08.



**නිම්නාදිනී ප්‍රනාන්දු**
04 ශ්‍රේණිය
සාන්ත මරියා දහම් පාසල, - මග්ගොන

**ශ්වේතා ආසනී පෙරේරා**
03 ශ්‍රේණිය
ශුද්ධවූ පවුලේ බාලිකා විදුහල
කුරුණෑගල



**ෂෙහාරි රොෂාලි**
07 ශ්‍රේණිය
දංකොටුව බාලිකා මහා විදුහල





**ක්ලෙමින් පෙරේරා**
04 ශ්‍රේණිය
සාන්ත අන්තෝනි දහම් පාසල
වැලිවේරිය



**ක්ලෙමන්ට් මැක්සිමස් ජයතිලක**
08 ශ්‍රේණිය
සාන්ත ජෝසප් දහම් පාසල
දෙනියාය

# විශ්වාසයේ වසරට මොරටුව - කටුකුරුන්ද ධර්මදූත ළමුන්ගෙන් චිත්‍ර ප්‍රදර්ශනයක්




මොරටුව කටුකුරුන්ද රෝස කුසුම ධර්මදූත ළමා සමාජය විශ්වාසය වසර වෙනුවෙන් සංවිධානය කළ චිත්‍ර ප්‍රදර්ශනයක් පසුගියදා කටුකුරුන්ද දහම් පාසල් ශාලාවේදී පැවැත්විණි. මෙම ප්‍රදර්ශනය කොළඹ කලාපයේ හා මොරටුව දිසාවේ සභාපති අසික ප්‍රියදර්ශන මහතා අතින් විවෘත කෙරිනි.

**සචිර සිල්වා**

## ශු. දොමිනික් සාවියෝ මුනිතුමා



**සචින් පීප්ස**
10 වසර
දොන් බොස්කෝ දෙව්සත්හල , කටුකෙන්ද
දංකොටුව

## දේව කැඳවීම් ජීවිතය

මෙම ජීවිතය හරි පුදුමාකාර ජීවිතයකි. මෙම කැඳවීම් ජීවිතය තුළ අපි දෙව් සමිඳුන් තුළ නිහතමානි තැම්පත් දරුවකු විය යුතුය. මෙම ජීවිතය තුළ මාගේ එකම හොඳ මිතුරා විය යුත්තේ කිතු සමිඳුන්ය. මෙම ජීවිතය තුළ මා හා දෙවි සමිඳුන් තුළ ඇතිවන සංවාදයකි. මෙය දේව තිළිණයකි. මා වැටෙන සියලු අවස්ථාවලදී උන්වහන්සේ මා උන් වහන්සේගේ දෑතින් උසුලයි. මා දුක් වන පසුතැවෙන අවස්ථා වලදී උන්වහන්සේ මා සනසනවා. මාගේ එකම සහනය උන්වහන්සෙයි. උන්වහන්සේ මා දිරිමත් කරනවා. උන්වහන්සේ මගේ දිව්‍ය එඬේරාණෝය රැකවරණයාණෝය. දිව්‍ය වෛද්‍ය වරයාණෝය.

උන්වහන්සේ මේ ජීවිතය තුළ මාව බොහෝ ආකාර යෙන් දිරිමත් කර මාව ශක්තිමත් කරනවා. උන්වහන්සේ මාව අහසේ තරු මෙන්ද, පොළවේ වැලි මෙන්ද මාව ආශිර්වාද කරනවා. මේ ජීවිතය තුළ දී මට විශේෂාකාර ලෙස විශාල මඟ පෙන්වීම් රාශියක් ලැබුණා. මේ ජීවිතය පුදුමාකාර වරප්‍රසාද ජනක ජීවිතයකි. මම උන්වහන්සේ ළඟට කිට්ටු වෙද්දි උන්වහන්සේගේ ආදරය, කරුණාව, උල්පතක් මෙන් මාගේ හද තුළට ගලන ආකාරය මට දැනිලා තියෙනවා. උන්වහන්සේ දානය කරන මේ ජීවිතය මිල කළ නොහැකි බව උන්වහන්සේ දිනපතා දේව වාක්‍ය තුළින් මට මඟ පෙන්වීම් ලබා දී මගේ ජීවිතය පෝෂණය කරනවා. මේ කැඳවීම් ජීවිතය තුළ උන්වහන්සේ මට ආරාධනා කරනවා උන්වහන්සේගේ දේව රාජ්‍යය ප්‍රකාශ කිරිමට.

**තාරුක දුල්ෂාන්**
11 වසර
දොන් බොස්කෝ දෙව්සත්හල , කටුකෙන්ද - දංකොටුව

## දේව ආදරය

අඳුරු සෙවණැලි මා වට කරලද්දි
නපුරාගේ දඬයමට මා හසුවෙද්දි
ඉදිරි මාවත් කඩා වැටෙද්දි
සවියක් විය ඔබේ දෙව් ආදරය
මා දිවි ගමනට
වුවද වහලෙකු මෙන් මා පාපයට
කළද අවමන් ඔබේ සුදු ආදරයට
කමා කළ නොහැකි වුවද
මගේ බර පාපයට ලැබුවෙමි
කමාව ඔබ දෙව් ආදරය තුළ

**විමුක්ති දිල්ෂාන්** - 11 ශ්‍රේණිය
දොන් බොස්කෝ දෙව්සත්හල,
කටුකෙන්ද - දංකොටුව

**කටුකෙන්ද ,**
**දංකොටුව**
**දොන් බොස්කෝ**
**දෙව්සත්හලේ**
**ශූර ළමා**
**ලේඛකයෝ**
**(වැඩමුළුවක ප්‍රතිඵලයක්)**

## තුරුළට නාවත්

තනුව :- උකුලට නාවත් ගීතය

තුරුලට නාවත් එදා වගේ - සමා වන්න සමිඳේ
ඔබගෙන් වෙන්වී දුර ගිය මා හට - සරණ වන්න සමිඳේ //
ඔබ ගැන නොසිතා මා ගැනම සිතා
ඔබ අමතක කළෙමි - සිතේ වාරු නැති වූ විට සමිඳේ
ඔබ ගැන සිහි වූයේ..... සමාවන්න සමිඳේ
ඔබ දුන් තලෙන්තු ඔබ හට නොපුදා
මා උපයා ගතිමි - සමා වන්න සමිඳේ .. මා හට

දිරි ලැබ දෙන්න සමිඳේ ඔබ හට දිවි පුදනට
ඔබ දුන් මිතුරන් අහක දමා මා ඔබ හට රිදෙව්වෙමි
ආදර සමිඳේ සමාව ලැබදී
මඟ පෙන්වනු සමිඳේ ..... මා දිවි කතර පුරා

**ජනිත ලක්ෂිත**
**දොන් බොස්කෝ දෙව්සත්හල**
**දංකොටුව**

# ප්‍රහේලිකා අංක 36




## හරහට

1. උත්පත්ති පොතේ සඳහන් ආකාරයට එකල මිනිසුන් එකම භාෂාවක් කතා කළ අතර ඔවුන් අහස උසට නැගීම සඳහා මෙම කොත සාදා ගත්හ.

3. ක්‍රිස්තු උත්ථානයෙන් පසු උන්වහන්සේ තම ශ්‍රාවකයන් සිටින තැනට වැඩම කර "මාගේ... ඇලයද බලන්න. අවිශ්වාස නොකර විශ්වාස කරන්න." තෝමස් තුමාට වදාළ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය.

4. ක්‍රිස්තුන් වහන්සේ පේදුරුට කතා කොට "ස්වර්ග රාජ්‍යයේ.......මම ඔබට දෙන්නෙමි." වදාළ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය.

6. ක්‍රිස්තුන් වහන්සේ සමාරිය ස්ත්‍රියට කතා කොට " මට...... ටිකක් දෙන්නැයි" වදාළ සේක. හිස්තැනට සුදුසු වචනය.

7. "කරුණ ඔබට වැටහේ නම් ඔබේ අසල් වැසියාට පිළිතුරු දෙන්න. එසේ නොවේ නම්, ඔබේ අතින්..... වසා ගන්න" යනුවෙන් උපදේශකයා හෙවත් සිරාක් පවසයි.

8. ක්‍රිස්තුන් වහන්සේ පූප වැඩිකිරීමේ ප්‍රාතිහාර්යය සිදු කිරීමට පෙර එක් ශ්‍රාවකයෙක් උන්වහන්සේට කතා කොට,...... රොටි පහක් මසුන් දෙදෙනෙක් ද, සිටින පිරිමි ළමයෙක් එහි සිටින බවත්, මෙපමණ සෙනඟකට එයින් ප්‍රයෝජනයක් නොමැති බවත් පැවසුවේය. මෙහි හිස්තැනට සුදුසු වචනය.

10. කානාහි සරණ මංගල්‍යය අවස්ථාවේදී දේව මෑණියන් එහි මිදියුෂ නැති බව ක්‍රිස්තුන් වහන්සේට පැවසූ විට උන්වහන්සේ තම...... තවම පැමිණ නැති බව ප්‍රකාශ කළ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය.

## පහළට

1. ".... මා වෙතට එන්න ඉඩ දෙන්න. ඔවුන් නොවළක්වන්න. දෙවියන් වහන්සේගේ රාජ්‍යය මෙබඳු අය සන්තකය" යනුවෙන් ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක. හිස් තැනට සුදුසු වචනය.

2. තම ගෝලයන්ගෙන් ඉතාම සුළු තැනැත්තෙකුට වුවද බොන්නට ඇල්වතුර කෝප්පයක් දෙන්නේ ද, ඔහුගේ පිපාසය නැති නොවන බව ආගන්තුක .... ට ලැබෙන විපාක පෙන්වීමේදී ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක. හිස් තැනට සුදුසු වචනය.

5. "ස්ත්‍රියකගේ ...... නොරැවටෙන්න" යනුවෙන් උපදේශකයා හෙවත් සිරාක් පවසයි. මෙහි හිස්තැනට සුදුසු වචනය.

7. "ඔබේ සිරුරට පහන ඔබේ ඇසය. ඇස් පෙනුම හොඳ නම් මුළු සිරුරම ආලෝකවත් ය" ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක. මෙහි සිරුරට සමාන වචනයකි.

9. අන්ධයකුට මඟ පෙන්වීමට අන්ධයකුට හැකිද? ඔවුන් දෙදෙනාම .... වැටෙන්නේ නැද්ද? යනුවෙන් ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක. හිස්තැනට සුදුසු වචනය.

**(මෙම ප්‍රහේලිකාව පිරවීමේ දී පහත සඳහන් බයිබල් පාඨ ද උපයෝගී කර ගත හැකිය. ශු.මාක් 10:14, ශු. මතෙව් 16:19, 10:40, ශු. ජුවාම් 6:9, 2, 20:27,ශු. ලූක් 11:34, 6:39, ශු. ජුවාම් 4:7, උපදේශකයා හෙවත් සිරාක් 5:12, 25:21, උත්පත්ති 11)**

**සැකසුම :- තිළිණි දුතිකා පෙරේරා**




**මිනු/ කටාන, ආඬිමුල්ල ප්‍රාථමික මිශ්‍ර විදුහලේ අන්තර් නිවාසයීය මලල ක්‍රීඩා උත්සවය මිනු/ කටාන හල්පේ සවැනි පාවුළු පාප් මහ විදුහලේ විදුහල්පති ගරු බර්නාඩ් නෙවිල් පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. ගරු පියතුමන් ජයග්‍රාහි සිසුවකුට පදක්කම් පළඳවන අයුරු මෙහි දිස්වේ.**

සේයා :- සිසිල් ඩැනිසියස්




වැඩකාරයා
මිතුරෝ දෙන්නාගෙන් "වැඩකාරයා" දවසකට නුදුටු නිසා අනිත් මිතුරා ඔහු සොයා ඔහුගේ නිවසට ගියා.... දැන් බලන්න මොකද වෙලා තියෙන්නෙ කියලා?

**ශු. ප්‍රැන්සිස් මුණිඳුන්ගේ කතාව**

# අසීසි නගරයේ දිළින්දා

ඉදිරිපත් කිරීම — ආමල් ද සිල්වා

16

